**උහන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**---------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | -------------------------------- |
| (i) | සභා භූමියේ ඉදිකර තිබුණු වාහන නැවතුම් ස්ථාන 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. මෙම වාහන නැවතුම් ස්ථාන වියදම් ප්‍රාග්ධන කිරීම සිදුකර නොමැත. ඉදිරි ගිණුම් කටයුතු වලදී වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.322,920 ක් වූ පරිගණක යන්ත්‍ර 03 ක වටිනාකම රු.280,800 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iii) | පුස්තකාල 03 කට අදාලව පරිග්‍රහණ ලේඛන අනුව මිලදී ගත් හා පරිත්‍යාග පොත්වල වටිනාකම රු.149,780 ක්, රු.110,803 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ගිණුම්ගත කිරීම් සිදුකර ඉදිරියට නිවැරදි කරනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ගිණුම් සකස් කරන විට මෙම ආදායම් පිළිබඳව තොරතුරු ලැබී නොතිබුණි. ඉදිරි ගිණුම් සැකසීමේදී එම ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (v) රජගලතැන්න පන්සල ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවිය යුතු රු.116,725 ක් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| බදු දී තිබුණු කඩකාමර 24 කින් 2008 සිට 2016 දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයකර ගතයුතු රු.221,933 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ මුල් කාලයේදීම අය කිරීමට කටයුතු කරනු ලැබේ |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| පෙර වර්ෂවලට අදාලව නිරවුල් නොකළ 2018 දෙසැම්බර් 31 දිනට රු.3,209,459 ක විවිධ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. පෙර වර්ෂ වල සිට පැවත එන අගයක් බැවින් ලේඛන පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.13,969,260 ක වත්කම් විෂයයන් 06 ක් හා රු.5,567,873 ක වගකීම් විෂයයන් 03 ක ක් අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගතිමි. වර්ෂයෙන් වර්ෂය ඉහත ගිණුම් විෂයයන් සඳහා අගයන් ගෙන ඇති නමුත්, ශේෂ ගෙන එමින් ලේඛන පවත්වා නැත. පෙර සකස් කළ ගිණුම් හා ලේඛන පරීක්ෂා කර බලා මෙම ලේඛන නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කරමි. |

**1.3.4 අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

| **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| i. 140 වගන්තිය | වරිපනම් බදු අයකිරීම සඳහා දේපල කාලීනව තක්සේරු නොකර 2007 වර්ෂයේ තක්සේරුවක් මත සමාලෝචිත වර්ෂයේදීද වරිපනම් බදු අයකර තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. තක්සේරු කිරීම සඳහා කටයුතු සිදුකර ඇත. |
| ii. 152 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති දුරකථන සමාගම් 03 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.39,000 ක මුදල අයකරගෙන නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 (ඒ) (1) වගන්තිය | නීතිමය කරුණු හා කොන්දේසි ඇතුලත් සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. | බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. |
| (ඇ) 1988 ප්‍රදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 59 | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකළ යුතු ආයතන හඳුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතු වේ. | හඳුනාගෙන ඇති කර්මාන්ත බදු අයකළ යුතු ආයතන නැත. මේ පිළිබඳව තවදුරටත් ආදායම් පරිපාලකවරුන් දැනුවත් කර සමීක්ෂණ වාර්තාවන් ලබාගෙන කටයුතු කිරීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රීති 217 | රු.62,656,258 ක් වූ සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. අංක 104 (4) | සභාව සතු කෘෂ කැබ් රථයක් 2017 වර්ෂයේ දී අනතුරට පත්වීම සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ii) | මු.රෙ. අංක 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගතයුතු වේ. | පිළිගනිමි. මේ වන විට සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන හා යන්ත්‍රෝපකරණ 10 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතු වේ. | පිළිගනිමි. වාර කිහිපයක මෝටර් රථ වාහන පරීක්ෂක වෙත ඉදිරිපත් කළද, කළ නොහැකි විය. ඉදිරියේ කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.1,325,437 ක් වටිනා පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. දැනට මෙමෙ පරිගණක උපාංග ඉන්වෙන්ට්‍රි ගතකර ඇත. |
| (ඊ) | වෙනත් චක්‍රලේඛ | | | |
| (i) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 22 දරන චක්‍රලේඛය | බල ප්‍රදේශයේ සියලු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වේ. | පිළිගනිමි. සභාව සතු දේපල ඉදිරියේදී තක්සේරු කිරීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 46 දරන චක්‍රලේඛය | සභාව සතු බදු දී තිබුණු උහන කඩකාමර 24 හි කුලිය වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී තක්සේරු කිරීමට නියමිතය. |

## 2. මූල්‍ය සමාලෝචනය
--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,335,440 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,024,652 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
--------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 1,944,785 | 1,641,072 | 1,185,513 | 3,876,744 | 1,069,876 | 1,044,785 | 1,043,573 | 3,414,214 |
| කුලී | 5,830,736 | 5,283,934 | 5,376,956 | 221,933 | 1,057,748 | 989,978 | 936,941 | 298,781 |
| බලපත්‍ර ගාස්තු | 830,000 | 744,165 | 744,165 | | 250,000 | 480,650 | 480,650 | |
| වෙනත් ආදායම් | 4,340,000 | 4,457,749 | 5,311,435 | 2,326,151 | 3,975,000 | 2,683,967 | 3,690,216 | 2,674,037 |

## 3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

### 3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා | පිළිගනිමි. අතුරු ව්‍යවස්ථා සෑදීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනවා ගතයුතු වේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

**-------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ---------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. |

**(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ---------- | ------------------------------ |
| උහන නව සතිපොළ භූමිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.1,838,188 වැයකර අත්තිවාරම් පමණක් යොදා තිබුණු අතර, වැඩ ආරම්භ කර නොතිබුණි. | සතිපොල භූමිය ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට සකස් කළ යුතු වේ. | ඉදිරියේදී පස් පුරවා මෙම උහන නව සතිපොල භූමිය පොළ පැවැත්වීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ---------- | ---------------------------- |
| කොම්පොස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 20 ක් හෙවත් රු.1,314,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත 2016 පෙබරවාරි 18 දින ලබාදී තිබුණි. ඉඩමේ අයතිය නිරවුල් නොවීම නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම දිගින් දිගටම ප්‍රමාදවී පැවතුණු අතර, ඒ හේතුවෙන් කසළ එක්රැස් කරන ට්‍රැක්ටරය දිනකට කිලෝමීටර 20 ක් වැඩියෙන් ධාවනය කිරීමට ද සිදුවී තිබුණි. තවද, 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් දක්වා අම්පාර නගර සභාව වෙත කසළ බැහැර කිරීම වෙනුවෙන් රු.364,800 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | සුදුසු ස්ථානයක් තෝරාගෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**(ඉ) තිරසාර සංවර්ධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී තිබුණ ද එයට අදාල ඉලක්ක හා අරමුණු හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | පිළිගතිමි. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2015, 2016 හා 2017 වර්ෂ වල අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම්පත් 61 ක් අතුරින් ගොඩනැගිලි සැලසුම්පත් 56 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597 දරන 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුකූලතා සහතිකය ලබා නොගෙන ගොඩනැගිල්ලක පදිංචි වූ, භාවිතා කරන හෝ ප්‍රයෝජනයට ගනු ලබන ගොඩනැගිලි සඳහා දිනකට රු.50 බැගින් දඩ මුදලක් අයකර අනුකූලතා සහතිකයක් නිකුත්කල යුතු වුවද, සභාව විසින් එසේ සිදුකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | පිළිගතිමි. |
| (ආ) 2007 වර්ෂයේදී ගොඩනැගිලි සැලසුම අනුමත කර ගොඩනැගිල්ලක 2015 ජූනි මස සිට 2018 වර්ෂය දක්වාම නොකඩවා වෙළඳ බලපත්‍ර ලබාගෙන එක්තරා පෞද්ගලික ලැගුම්හලක් පවත්වාගෙන ගොස් තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.63,900 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | පෞද්ගලික ලැගුම්හලෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.63,900 ක මුදල අයකරගත යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය හා නාගරික සංවර්ධන අධිකාරියේ අංක 08/01/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, සහා බල ප්‍රදේශයේ සිදුකර තිබුණු ඉදිකිරීම් 15 ක් සම්බන්ධයෙන් සැලසුම් කමිටු අනුමැතිය ලබාදී නොතිබුණු අතර, ගැසට්පත්‍රය ප්‍රකාරව | බල ප්‍රදේශයේ සිදුකර තිබුණු අනවසර ඉදිකිරීම් 15 න් ගැසට්පත්‍රය ප්‍රකාරව අයකරගත යුතු රු.120,236 ක මුදලක් අයකර ආවරණ අනුමැතිය ලබාදීම හෝ නාගරික සංවර්ධන අධිකාරි | මේ පිළිබඳ ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| අයකරගත යුතු රු.120,236 ක මුදලක් අයකර ආවරණ අනුමැතිය ලබාදීමට හෝ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව නීතිමය කටයුතු සිදුකිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව නීතිමය කටයුතු සිදුකිරීම හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතු වේ. | |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 09 ක පුරප්පාඩු 16 ක් හා තනතුරු 02 ක අතිරික්ත 02 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු අතර අතිරික්ත සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) ස්ථාන මාරුවීම් ලැබූ සේවකයන් 13 දෙනෙකුගෙන් සහ විශ්‍රාම ගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.94,712 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. සේවක ණය අයකර ගැනීමට අදාල අයට වරින් වර දැනුවත් කිරීම් සිදුකර ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් 2001 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුලදී සභාවට ලැබුණු වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක හා ඉඩම් කැබලි 63 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | දේපල වල හා යන්ත්‍රෝපකරණ වල නිත්‍යානුකූල අයිතිය පවරා ගත යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී පවරා ගැනීමට නියමිතය. |

### 3.4.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සහා බල ප්‍රදේශයේ සුසාන භූමි 05 ක් එළපෙහෙලි කර වැටවල් සකසා උද්‍යාන ලෙස සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.180,283 ක වියදමක් දරා සකස් කරන ලද කොන්ක්‍රීට් කණු 192 ක් අදාල කාර්යයට යොදා නොගෙන සහා භූමියේ ගොඩගසා තිබුණි. | කොන්ක්‍රීට් කණු 192 අදාල කාර්යයට යොදාගත යුතු වේ. | පිළිගතිමි. මේ පිළිබඳ අදාල සුහසාධන සමිතිය දැනුවත් කොට ඇතත් කොන්ක්‍රීට් කණු රැගෙන ගොස් නැත. නැවත දැනුවත් කර ඇත. |

### 3.4.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1994 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුල සභාවට ලැබුණු වාහන හා යන්ත්‍රෝපකරණ 10 ක් සම්බන්ධයෙන් ලියාපදිංචිය පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන හා යන්ත්‍රෝපකරණ ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි |
| (ආ) සභාව සතු වාහන 10 ක ආදායම් බලපත්‍ර ලබාගැනීමට 2018 වර්ෂය අවසාන වන විටත් කටයුතු නොකර ධාවනයේ යොදවා තිබුණි. | වාහන වල ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි |
| (ඇ) සභාව සතු රු.1,500,000 ක් වටිනා ට්‍රැක්ටර් රථ 02 ක් රක්ෂණය කර නොතිබුණි. | වාහන රක්ෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි |

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරි වර්ෂවල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. |